JMC vLearning
"your virtual learning partner"

# ව්‍යාපාර සංවිධාන

## AAT අදියර I

BEN - ව්‍යාපාර පරිසරය

තරංග ජයනන්ද
B.Sc. (Business Administration) Sp. (USJP)

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917




## ව්‍යාපාර සංවිධාන හැඳින්වීම

ලාභ ඉපැයීම හෝ සමාජ සුභසාධනය අරමුණු කරගෙන පුද්ගල අවශ්‍යතා සහ වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, බෙදා හැරීම හා අලෙවි කිරීම යන කාර්යයන් ඉටු කිරීම සඳහා බිහිවී ඇති පුද්ගලයින්ගෙන් සමන්විත ආර්ථික ඒකකයකි.

## සංවිධානය ක්‍රමය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග

1. කේවල ස්වාමි ව්‍යාපාර
2. හවුල් ව්‍යාපාර
3. බද්ධ ව්‍යාපාර
4. සංස්ථාපිත සමාගම්
5. සමූපකාර
6. වරලත් ව්‍යාපාර
7. රාජ්‍ය දෙපාර්තමේන්තු
8. රාජ්‍ය සංස්ථා
9. රාජ්‍ය සමාගම්

# විවිධ ලක්ෂණ අනුව ව්‍යාපාර වර්ග කිරීම

01 . සංස්ථාපිත ව්‍යාපාර සහ සංස්ථාපිත නොවන ව්‍යාපාර

කිසියම් **සුවිශේෂී නීතියක් පදනම් කරගෙන** බිහි වී ඇති ව්‍යාපාර **සංස්ථාපිත ව්‍යාපාර** වන අතර එසේ **නීතිමය පදනමකින් තොරව** බිහි කළ හැකි ව්‍යාපාර **සංස්ථාපිත නොවන** ව්‍යාපාර වේ.

*ලියාපදිංචිය සහ සංස්ථාපනය*

කිසියම් නාමයක් යටතේ ව්‍යාපාරයක් ආරම්භ කළ බවට අදාළ නීතිය යටතේ නියමිත ආයතනයකින් බලපත්‍රයක් ලබා ගැනීම ලියාපදිංචිය ලෙස හැඳින්වේ.

සංස්ථාපනය යනු කිසියම් නීතියක දක්වා ඇති ක්‍රියාපටිපාටියකට අනුකූලව ව්‍යාපාරයක් බිහිකිරීමයි. මෙහිදී ලියාපදිංචිය තුලින් ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් හිමි වේ.

02 . නීතිමය පුද්ගලභාවය

ව්‍යාපාරයකට සිය නමින් නීතිමය කටයුතු කිරීමට ඇති හැකියාව හෙවත් ව්‍යාපාරයක් එහි අයිතිකරුගෙන් වෙන්වූ වෙනම ඒකකයක් ලෙස නීතිය ඉදිරියේ පිලිගැනීම වේ.

ව්‍යාපාරයකට නීතිමය පුද්ගලභාවයක් හිමි වීමට නම් එය සංස්ථාපිත ව්‍යාපාරයක් වීම අත්‍යාවශ්‍ය වේ.

03 . වගකීමේ ස්වභාවය

ව්‍යාපාරයේ ණය හා වෙනත් බැඳීම් සම්බන්ධයෙන් එහි හිමිකරුවන් වෙත ඇති බැඳීම වගකීමයි. වගකීමේ ස්වභාවය අනුව වගකීම සීමිත හා වගකීම අසීමිත ලෙස ව්‍යාපාර ප්‍රධාන කොටස් 2ක් දැකිය හැක.

JMC vLearning "your virtual learning partner"

04 . අඛණ්ඩ පැවැත්ම හෙවත් නිත්‍ය සන්තික හැකියාව

හිමිකරුගේ මිය යාම හෝ ඉවත්වීම, බුන්වත් වීම, සිහිවිකල වීම සිදුවුවද බාධාවකින් තොරව ව්‍යාපාරයේ පැවැත්ම අඛණ්ඩව සිදුවන බවයි.

05 . හිමිකාරිත්වය

හිමිකාරිත්වය මත ව්‍යාපාර සංවිධාන ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන සහ පොදු අංශයේ ව්‍යාපාර සංවිධාන ලෙස කොටස් දෙකකට බෙදිය හැක.

# තනි පුද්ගල ව්‍යාපාර

හිමිකාරිත්වය තනි පුද්ගලයකු සතු වන තනි පුද්ගලයෙකු විසින් ප්‍රාග්ධනය යොදා ලාභ ලැබීමේ අරමුණින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර කේවල ස්වාමි ව්‍යාපාර වේ.

තනි පුද්ගල ව්‍යාපාරයකට බලපාන පොදු නීති

1. ලියාපදිංචියට අදාල නීති

   1918 ව්‍යාපාර නාම ආඥා පනත

2. විශේෂ බලපත්‍ර ලබා ගැනීමට අදාල නීති

   ඔසුසැල් සඳහා (2015) අංක (05) දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත

3. ව්‍යාපාර කරගෙන යාමේදී බලපාන අතුරු නීති

   පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත, ආහාර පනත, මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනත

JMC vLearning "your virtual learning partner"

4. සේවකයින් සම්බන්ධ නීති/ කම්කරු නීති

   සාප්පු හා කාර්යාල සේවක පනත, සේවක අර්ථසාධක අරමුදල් පනත, පාරිතෝෂික ගෙවීම් පනත, වෘත්තීය සමිති ආඥා පනත, කාර්මික ආරවුල් පනත

5. ව්‍යාපාර ආරම්භ කරන ප්‍රදේශයේ විශේෂ අවසර ලබා ගැනීම්

   නාගරික සංවර්ධන අධිකාරිය, නගර සභාව, ප්‍රාදේශීය සභාව වැනි ආයතන වලින් අවසර ලබා ගැනීම්

6. ව්‍යාපාර සඳහා බලපාන වෙනත් විශේෂ නීති

   පරිසර ආරක්ෂණ බලපත්‍ර (මධ්‍යම පරිසර අධිකාරිය)

JMC vLearning "your virtual learning partner"

කේවල ස්වාමි ව්‍යාපාරයක ලක්ෂණ

1. අයිතිය - තනි පුද්ගලයකු සතුය
2. ප්‍රාග්ධනය - අයිතිකරු විසින් තනිව සපයයි
3. පරිපාලනය හා තීරණ ගැනීම - අයිතිකරු විසින් හෝ ඔහුගේ අධීක්ෂණය යටතේ පරිපාලනය සිදුවන අතර ව්‍යාපාරික තීරණ ගනු ලබන්නේ ව්‍යාපාරිකයා විසින්මය
4. වගකීම - වගකීම අසීමිත වේ
5. නීතිමය පුද්ගලභාවය - නීතිමය පුද්ගලභාවයක් හිමි නොවේ
6. ලාභ අලාභ - තනිව භුක්ති විඳියි

7. බදු ගෙවීම - තනි පුද්ගලයකු සතුය

8. අඛණ්ඩ පැවැත්ම - අඛණ්ඩ පැවැත්මක් නැත

9. ලියාපදිංචිය - අනිවාර්ය නැත. අයිතිකරුගේ නමින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යනු ලබන්නේ නම් (1918) අංක (06) දරණ ව්‍යාපාර නාම ආඥා පනත පදනම් කොට ගෙන ව්‍යාපාරය අයත් පළාත් සභාවේ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය අනුව පළාත් සභාවේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කළ යුතුය

10. ගිණුම් තැබීම හා විගණනය - අත්‍යවශ්‍ය නොවේ . අරමුදල් කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා පවත්වා ගත හැකිය

කේවල ස්වාමි ව්‍යාපාර ක්‍රමයේ වාසි

1. පහසුවෙන් හා අවම පිරිවැයකින් ආරම්භ කළ හැකි වීම
2. නීතිමය බලපෑම අඩු වීම
3. ලාභ තනිව භුක්ති විදිය හැකි වීම
4. පාලනය හා තීරණ ගැනීම පහසු වීම
5. පෞද්ගලික කැපවීම් මත ව්‍යාපාරය දියුණු කළ හැකි වීම
6. ව්‍යාපාරික රහස්‍යභාවය ආරක්ෂා වීම
7. ව්‍යාපාරය විසුරුවා හැරීම පහසුවීම
8. ආත්ම තෘප්තිය
9. ගනුදෙනුකරුවන් සමග සෘජු සම්බන්ධතා ගොඩනගාගත හැකි වීම
10. ඉහළ අරපිරිමැස්මකින් කටයුතු කළ හැකි වීම.

කේවල ස්වාමි ව්‍යාපාර ක්‍රමයේ අවාසි

1. අයිතිකරුගේ වගකීම අසීමිත වීම
2. ප්‍රාග්ධන මාර්ග සීමාසහිත වීම
3. අයිතිකරුගේ කළමනාකරණ හා ව්‍යවසායකත්ව හැකියාවන් මත ව්‍යාපාරික තීරණ වල සාර්ථකත්වය රඳා පැවතීම
4. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
5. අලාභ අයිතිකරු තනිව විඳදරා ගත යුතු වීම
6. නීතිමය පුද්ගලභාවයක් නොමැති වීම
7. දක්ෂ සේවකයන් ආකර්ෂණය කර ගැනීම දුෂ්කර වීම
8. ව්‍යාපාරය පුළුල් වන විට කළමනාකරණය අපහසුවීම.

# හවුල් ව්‍යාපාර

ලාභ ලැබීමේ පරමාර්ථය මත පොදුවේ ව්‍යාපාර කටයුත්තක් පවත්වාගෙන යන පුද්ගලයන් අතර වූ සම්බන්ධතාවකි.

හවුල් ව්‍යාපාරයක් ඇතිවීමට අනිවාර්යෙන්ම තිබිය යුතු ලක්ෂණ

1. පුද්ගලයින් දෙදෙනකු හෝ වැඩි ගණනක් සිටීම
2. ව්‍යාපාරයක් පැවතීම - වෙළඳාමක්, රැකියාවක් හෝ වෘත්තීමය කටයුත්තක් වැනි ව්‍යාපාරික මුහුණුවරක් ගත් කාර්යයක හවුල් ව්‍යාපාරය නියුක්ත විය යුතු බවයි
3. ගිවිසුමක් පැවතිය යුතු බව
4. ලාභ බෙදා ගන්නා ආකාරය පිළිබඳව එකගතාවක් පැවතීම
5. අන්‍යෝන්‍ය නියෝජ්‍යත්වය.

JMC vLearning "your virtual learning partner"

## හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ උපරිම සංඛ්‍යාව

පහත වෘත්තීය ක්ෂේත්‍ර වල හැර හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ උපරිම සංඛ්‍යාව (20) කි.

1. නීතිඥයන්ගේ හවුල් ව්‍යාපාර
2. ගණකාධිකාරිවරුන්ගේ හවුල් ව්‍යාපාර
3. කොටස් තැරැව්කරුවන්ගේ හවුල් ව්‍යාපාර
4. වෙනත් වෘත්තීය ක්ෂේත්‍රයන්හි හවුල් ව්‍යාපාර

## හවුල් ව්‍යාපාරයක මූලික ලක්ෂණ

1. අයිතිය - හවුල්කරුවන් 02ත් 20ත් අතර සංඛ්‍යාවකට සීමා වීම
2. ප්‍රාග්ධනය - හවුල්කරුවන් ගිවිසගත් පරිදි ප්‍රාග්ධනයට දායක වීම
3. පාලනය - හවුල්කරුවන්ගේ සාමූහික පාලනය සහ හවුල් නීතිය අනුව පාලනය සිදු වේ
4. වගකීම - වගකීම අසීමිත වේ
5. කළමනාකරණය - සියලු හවුල්කරුවන් හෝ හවුල්කරුවන් කිහිප දෙනෙකු විසින් සිදු කරයි
6. නීතිමය පුද්ගලභාවය - නීතිමය පුද්ගලභාවයක් හිමි නොවේ
7. ලාභ අලාභ - හවුල්කරුවන් ගිවිසගත් පරිදි ලාභ අලාභ බුක්ති භුක්ති විඳී

8. බදු ගෙවීම - ව්‍යාපාරය නමින් බදු ගෙවිය නොහැකි අතර හවුල්කරුවන් තනි තනිව බදු ගෙවීම කළ යුතු වේ

9. අඛණ්ඩ පැවැත්ම - අඛණ්ඩ පැවැත්මක් නැත

10. ලියාපදිංචිය - සියලු හවුල්කරුවන්ගේ නම්වලින් පවත්වාගෙන යන්නේ නම් ලියාපදිංචිය අනිවාර්ය නොවේ

11. ගිණුම් තැබීම හා විගණනය - අත්‍යවශ්‍ය නොවේ. අරමුදල් කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා පවත්වා ගත හැකිය

12. විසුරුවා හැරීම - අධිකරණය මගින් හෝ ස්වෙච්ඡාවෙන් විසුරුවා හැරීම සිදුවේ.

හවුල් ව්‍යාපාර කෙරෙහි බලපාන අණපනත්

1. 1980 හවුල් ව්‍යාපාර ආඥා පනත

   හවුල් ඇරඹීම, පවත්වාගෙන යාම හා විසුරුවා හැරීමට අදාළ මූලික නීතිමය ප්‍රතිපාදන මෙන්ම හවුල් ඔප්පුවක් නොමැති අවස්ථාවල කටයුතු කළ යුතු ආකාරය දැක්වීම

2. 1840 අංක 7 දරණ වංචා වැළැක්වීමේ ආඥා පනත

   රුපියල් 1000ට වඩා වැඩි ආරම්භක ප්‍රාග්ධනයක් ඇතිව විට හවුල් ගිවිසුම ලිඛිත විය යුතු බව

3. 2007 අංක 7 දරණ සමාගම් පනත

   උපරිම හවුල්කරුවන් 20කට සීමා කිරීම

JMC vLearning "your virtual learning partner"

4. 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත

හවුල්කරුවන්ගේ නම්වලින් හැර වෙනත් නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබයි නම් එකී නාමය ලියාපදිංචි කළ යුතු බව

5. 1907 සීමාසහිත සහිත හවුල් ව්‍යාපාර ආඥා පනත

සීමිත හවුලක් සම්බන්ධව විස්තර දැක්වේ. එනම් හවුල්කරුවන්ගේ වගකීම ඔවුන් යෙදවූ ප්‍රාග්ධනයට පමණක් සීමා වන එහෙත් යටත් පිරිසෙන් වගකීම අසීමිත වන එක් හවුල්කරුවකු හෝ සිටින හවුල් ව්‍යාපාර සීමාසහිත හවුල් ව්‍යාපාර ලෙස හඳුන්වයි.

JMC vLearning "your virtual learning partner"

හවුල් ව්‍යාපාරයක්/ ගිවිසුමක් ඇති විය හැකි ආකාර

1. පාර්ශවකරුවන්ගේ ඇගවීමෙන්
2. වාචික එකඟතාවයෙන්
3. ලිඛිත එකඟතාවයකින්

හවුල් ව්‍යාපාරයක් ආරම්භකර පවත්වාගෙන යාමට අදාළව හවුල්කරුවන් අතර ඇතිවන ව්‍යංග, වාචික හෝ ලිඛිත එකඟත්වය හවුල් ගිවිසුම වන අතර හවුල් ගිවිසුම ලිඛිතව හා අත්සන් සහිත වූ විට එය හවුල් ඔප්පුව නැතහොත් හවුල් ව්‍යවස්ථාවලිය බවට පත්වේ.

### හවුල් ඔප්පුවක් ඇතිකර ගැනීමේ වාසි

1. හවුල් ඔප්පුවේ ඇති කොන්දේසි අනුව කටයුතු කළ හැකිවීම
2. මතභේද අඩු කරගත හැකි වීම
3. ගැටලු පැන නැගුණු විට ඒවා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරමින් විසඳාගත හැකි වීම
4. නීතිය ඉදිරියේ බලාත්මක කළ හැකි වීම.

### හවුල් ඔප්පුවක ඇතුළත් කළ යුතු මූලික කරුණු

1. හවුල් ව්‍යාපාරයේ නම සහ ලිපිනය
2. හවුල්කරුවන්ගේ නම් සහ ලිපිනයන්
3. ව්‍යාපාරයේ ස්වභාවය
4. ව්‍යාපාරයේ අරමුණු
5. හවුල් ව්‍යාපාරය කාලසීමාව යනාදිය.

JMC vLearning
"your virtual learning partner"

### හවුල් ඔප්පුවක ඇතුළත් කළ යුතු කොන්දේසි

1. හවුල්කරුවන් ප්‍රාග්ධනයට දායක වන ආකාරය - මුදලින්/වත්කම්වලින්/කීර්ති නාමයෙන්
2. ලාභ අලාභ බෙදා ගන්නා ආකාරය
3. හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම්
4. හවුල්කරුවන් කළමනාකරණයට දායක වන ආකාරය
5. හවුල්කරුවන් අතර මත මතභේද නිරාකරණය කරගන්නා ආකාරය
6. හවුල්කරුවන්ට ගෙවීම් පිළිබඳව
7. හවුල්කරුවන්ගේ ගැනිලි පිළිබඳව හා ගැනිලි පොලී අය කරන ආකාරය
8. ප්‍රාග්ධනයට පොළී ගෙවන ආකාරය

9. ප්‍රාග්ධනයට අමතරව ව්‍යාපාරයට ණය සැපයීම් හා ඒ සඳහා පොලී ගෙවීම් පිළිබඳව
10. නව හවුල්කරුවන් බඳවා ගැනීමේ අවකාශය, සිටින හවුල්කරුවකු ඉවත්ව යාම, විශ්‍රාම ගැනීම සහ හවුල්කරුවකුගේ මරණයේ දී කටයුතු කරන ආකාරය හා එහිදී කීර්තිනාමය ගණනය කරන ආකාරය
11. හවුල් ව්‍යාපාරය විසුරුවා හරින ආකාරය හා එහිදී වත්කම් බෙදාහැරීම පිළිබඳව, මූල්‍ය තත්ව ප්‍රකාශය සහ ගිණුම් වාර්තා පිළියෙල කිරීම පිළිබඳව.

හවුල් ඔප්පුව වලංගු වීමට නම් සියලු හවුල්කරුවන් ඊට අත්සන් කර නියමිත මුද්දර ගාස්තු ගෙවා නොතාරිස්වරයකු ලවා සහතික කළ යුතුය.

JMC vLearning "your virtual learning partner"

හවුල්කරු

ලාභ ලැබීමේ චේතනාවෙන් තම වත්කම්, හැකියාවන් හෝ නාමය එක්තැන් කොට ඒ පිළිබඳව ඇතිවන වගකීම් සාමූහිකව විඳ දරා ගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාමට එකඟ වන පුද්ගලයකු හෝ ආයතනයක් හවුල්කරුවකු ලෙස හැඳින්වේ.

හවුල්කරුවන් වර්ග

1. සාමාන්‍ය හවුල්කරු
2. ක්‍රියාකාරී හවුල්කරු
3. අක්‍රිය හෝ නිදන හවුල්කරු
4. සීමිත හවුල්කරු
5. නිහඬ හවුල්කරු
6. රහස්‍ය හවුල්කරු
7. ප්‍රමුඛ හවුල්කරු
8. ලාභ පමණක් ලබන හවුල්කරු
9. ආරූඪ හවුල්කරු
10. නාමමාත්‍ර හවුල්කරු

## හවුල්කරුවන් වර්ග හඳුනා ගැනීමේදී සලකා බැලෙන මූලික ලක්ෂණ

1. ප්‍රාග්ධනයට දායක වීම
2. කළමනාකරණයට සහභාගීවීම
3. ලාභ අලාභ භුක්තිවිඳීම
4. මහජනයාගේ දැනුවත් බව
5. වගකීමේ ස්වභාවය
6. වැටුප් ලබන බව.

## සාමාන්‍ය හවුල්කරු

ප්‍රාග්ධනයට දායක වන කළමනාකරණ කටයුතු වල නියැලෙන, වගකීම අසීමිත, මහජනයා හවුල්කරුවකු බව දන්නා හා සියලු ව්‍යාපාරික වරප්‍රසාද භුක්ති විඳින හවුල්කරු සාමාන්‍ය හවුල්කරු ලෙස හැඳින්වේ.

## ක්‍රියාකාරී හවුල්කරු

හවුල් ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු සඳහා ක්‍රියාකාරීව සහභාගි වන වගකීම අසීමිත වන සාමාන්‍ය හවුල්කරුවකු ක්‍රියාකාරී හවුල්කරුවකු ලෙස හඳුන්වයි. මොවුන් බොහෝවිට ලාභයට අමතරව වැටුපක්ද ලබයි.

## අක්‍රිය හෝ නිදන හවුල්කරු

ප්‍රාග්ධනය යොදා ලාභයට හෝ පාඩුවට දායකවන, කළමනාකරණයට සහභාගී නොවන, හවුල්කරුවකු බව මහජනයා නොදන්නා, වගකීම් අසීමිත හවුල් හවුල්කරුවකු නිදන හවුල් හවුල්කරුවකු ලෙස හැඳින්වේ.

JMC vLearning "your virtual learning partner"

සීමිත හවුල්කරු

වගකීම තමන් යෙදූ ප්‍රාග්ධනයට සීමා වන, කළමනාකරණ කටයුතු සඳහා සහභාගී නොවන, හවුල්කරුවකු බව මහජනයා නොදන්නා, යෙදූ ප්‍රාග්ධනය ගැනිලි ලෙස ඉවත් කර ගැනීමට හිමිකමක් නොමැති, හවුල්කරුවන් වෙනුවෙන් නියෝජ්‍යත්වයේ නියැලීමට නොහැකි හවුල්කරුවන් සීමිත හවුල්කරුවන් ලෙස හඳුන්වයි. මොවුන් මියයාම බංකොලොත් වීම හවුල් ව්‍යාපාරයේ පැවැත්ම කෙරෙහි බලපෑමක් ඇති නොකරයි.

නිහඬ හවුල්කරු

ප්‍රාග්ධනය යොදා ලාභ අලාභ භුක්ති විඳින එහෙත් කළමණාකරන කටයුතුවලට සහභාගී නොවන වගකීම අසීමිත, හවුල්කරුවකු බව මහජනයා දන්නා හවුල්කරු නිහඬ හවුල්කරු ලෙස හඳුන්වයි.

ප්‍රමුඛ හවුල්කරු

හවුල් ඔප්පුවේ හෝ අනෙකුත් ලියකියවිලි වල මුලින්ම නම සඳහන් වන සාමාන්‍ය හවුල් හවුල්කරුවකු වේ. බඳු ගෙවීම් හෝ වෙනත් කටයුතු සම්බන්ධව මුලින්ම ඇමතුම් ලබන්නේ මෙම හවුල්කරුය.

ආරූඪ හවුල්කරු

ප්‍රාග්ධනයට දායක නොවී ඒ වෙනුවට ණය මුදලක් ලබා දී වාර්ෂික ලාභය මත වෙනස් වන පොලියකට හිමිකම් කියන හවුල්කරුවන් වේ. ඇතැම් විට හවුල්කරුවෙකු විශ්‍රාම යාමේදී ඔහුට ව්‍යාපාරයෙන් ලැබිය යුතු මුදල මෙසේ ණය මුදලක් ලෙස සපයයි. ඔහු හවුල්කරුවකු බව මහජනයා දනී. වගකීම් අසීමිත වේ එමෙන්ම කළමනාකරණ කටයුතුවලට සහභාගි නොවේ.

JMC vLearning "your virtual learning partner"

### රහස්‍ය හවුල්කරු

හවුල් ව්‍යාපාරයට ප්‍රාග්ධනය යොදා ලාභ අලාභ බුක්ති භුක්තිවිඳින, කළමනාකරණ කටයුතු වල යෙදෙන, වගකීම අසීමිත, හවුල්කරුවකු බව මහජනයාට නොදැනෙන ලෙස කටයුතු කරන හවුල්කරුවකු රහස්‍ය හවුල් හවුල්කරුවකු නමින් හැඳින්වේ.

### ලාභ පමණක් ලබන හවුල්කරු

ප්‍රාග්ධනයට දායක වන, අසීමිත වගකීමක් දරන එමෙන්ම ලාභ පමණක් ලබන හවුල් හවුල්කරුවන් වේ. මොවුන් අලාභය සඳහා දායක නොවන අතර මෙවැනි හවුල්කරුවන්ට ව්‍යාපාරයේ කළමණාකරනයට සහභාගිවීමට අවසර නැත.

### නාමමාත්‍ර හවුල්කරු

හවුල් ව්‍යාපාරයට ප්‍රාග්ධනය නොයොදා වෘත්තීය වශයෙන් හෝ ව්‍යාපාරිකයෙකු වශයෙන් දිනා සිටින සිය කීර්ති නාමය පමණක් යොදා ලාභ අලාභ බුක්ති භුක්තිවිඳින හවුල්කරු මින් අදහස් වේ. මොහු ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතුවලට සහභාගී නොවන අතර වගකීම අසීමිත වේ.

### හවුල්කරුවකු සතු අයිතිවාසිකම්

1. ව්‍යාපාර කටයුතු වලට සහභාගි වීමට ඇති අයිතිය
2. ව්‍යාපාර කටයුතුවලට උපදෙස් දීමට අදහස් හුවමාරු කරගැනීමට ඇති අයිතිය
3. ව්‍යාපාරය උපයන ලාභයට දායක වීමට ඇති අයිතිය
4. ගිණුම් පොත් වලට ප්‍රවේශ වීමට ඇති අයිතිය
5. ව්‍යාපාරයට සපයන ණය අත්තිකාරම් සඳහා පොලී ලබාගැනීමට ඇති අයිතිය
6. යෙදූ ප්‍රාග්ධනයට පොලී ගෙවයි නම් එය ලබාගැනීමට ඇති අයිතිය
7. නව හවුල්කරුවකරුවන් බඳවාගැනීම සම්බන්ධව තීරණ වලට සහභාගි වීම
8. හවුල් ව්‍යාපාරයෙන් ඉවත් වීම හෝ විශ්‍රාම යාම
9. හවුල් ව්‍යාපාරයෙන් ඉවත් නොකිරීමට ඇති අයිතිය
10. තරඟකාරී නොවන වෙනත් ව්‍යාපාර වල යෙදීමේ අයිතිය.

### හවුල්කරුවකු සතු යුතුකම්

1. උපරිම විශ්වාසයෙන් කටයුතු කිරීම
2. අලාභ සඳහා දායක වීම
3. රහස් ලාභ නොලැබීම
4. තරගකාරී වෙනත් ව්‍යාපාරවල නොයෙදීම
5. හවුල්කරුවකු අතින් අලාභ හානියක් සිදුවුවහොත් එය පූර්ණය කිරීම
6. තම බලතල ඉක්මවා කටයුතු නොකිරීම
7. සෑම හවුල්කරුවකුම පුද්ගලිකව හා සාමූහිකව ව්‍යාපාරයේ වගකීමට යටත් වීම
8. ගෙවීමක් නොලබා හවුල් වූ ව්‍යාපාරයේ කටයුතු කිරීම
9. ව්‍යාපාර කටයුතු වලට දැඩි උනන්දුවෙන් සහභාගී වීම
10. ව්‍යාපාරයේ දේපල තම පෞද්ගලික දේපළ සේ සලකා පරිහරණය නොකිරීම.

### හවුල් ව්‍යාපාර විසුරුවා හැරීම

- හවුල විසුරුවා හැරීම
- හවුල් ව්‍යාපාර ආයතනය විසුරුවා හැරීම
  - ස්වේච්ඡාවෙන් විසුරුවා හැරීම
  - අධිකරණ නියෝගයක් මත විසුරුවා හැරීම

හවුල්කරුවන් අතර පවත්නා සම්බන්ධතාවයේ කිසියම් වෙනසක් සිදුවීම හවුල විසුරුවා හැරීමක් ලෙස සැලකේ.

ස්වෙච්ඡාවෙන් හෝ අධිකරණයක් මගින් හවුලක් විසුරුවා හැරීමේදී හවුලේ සියලු ව්‍යාපාර කටයුතු නිමා වන්නේ නම් එය හවුල් ව්‍යාපාර ආයතනය විසුරුවා හැරීම ලෙස හඳුන්වයි.

JMC vLearning
"your virtual learning partner"

### හවුල්කරුවකු බුන්වත් වීම

යම් හවුල්කරුවකුට බාහිර පාර්ශවයන්ට ඇති වගකීම් පියවීමට නොහැකි තත්ත්වයක් ඇතැයි අධිකරණය මගින් තීරණය කිරීම හවුල්කරුවකු බුන්වත් වීම ලෙස හඳුන්වයි. බුන්වත් හවුල්කරුවකුගේ වගකීම් සම්බන්ධයෙන් සාමූහික එකඟත්වය අනුව කටයුතු කිරීම හෝ ගානර් එදිරිව මරේ නඩු තීන්දුව අනුව කටයුතු කිරීම කළ හැකිය.

බුන්වත් හවුල්කරුගේ ප්‍රමාණය නුබුන්වත් හවුල්කරුවන් ශේෂ පත්‍රයේ දැක්වෙන ප්‍රාග්ධන ගිණුම් ශේෂයන්හි අනුපාතයට යෙදවීම ගානර් එදිරිව මරේ නඩුවෙන් ප්‍රකාශ වේ.

## බද්ධ ව්‍යාපාර

කිසියම් ව්‍යාපෘතියක් සඳහා නිශ්චිත කාලයකට ව්‍යාපාර ආයතන දෙකක් හෝ වැඩි ගණනක් එක්වී පිහිටුවා ගන්නා සන්ධානය මින් අදහස් වේ. මෙය එක් එක් සමාගම් වලින් වෙන් වූ නව ව්‍යාපාර ඒකකයකි. අදාල ව්‍යාපෘතිය නිම වීමෙන් පසු බද්ධ ව්‍යාපාරයට නිමාවට පත්වේ.

### බද්ධ ව්‍යාපාරයක ප්‍රධාන ලක්ෂණ

1. පාර්ශව දෙකක් හෝ වැඩි පිරිසක් සහභාගී වීම
2. කෙටි කාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ තාවකාලික ව්‍යාපෘතියක් වීම
3. බොහෝවිට ව්‍යාපාරික නාමයක් හෝ නිශ්චිත වූ ව්‍යාපාරික ස්ථානයක් නොමැත
4. ලියාපදිංචිය අවශ්‍ය නොවේ
5. බලපාන විශේෂ නීති නොමැත
6. අඛණ්ඩ පැවැත්මක් නොමැත.

JMC vLearning "your virtual learning partner"

## බද්ධ ව්‍යාපාරයක හා හවුල් ව්‍යාපාරයක සමානකම්

1. වගකීම අසීමිත වීම
2. නෛතික පුද්ගල භාවයක් නොමැති වීම
3. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
4. ලියාපදිංචිය අනිවාර්ය නොවීම.

## බද්ධ ව්‍යාපාරයක හා හවුල් ව්‍යාපාරයක අසමානකම්

| හවුල් ව්‍යාපාරය | බද්ධ ව්‍යාපාරය |
|---|---|
| සාපේක්ෂ වශයෙන් දිගු කාලීන වේ | කෙටි කාලීන (තාවකාලික) වේ |
| නිශ්චිත ව්‍යාපාර ස්ථානයක් හෝ නමක් පැවතීම | බොහෝවිට නිශ්චිත ව්‍යාපාර ස්ථානයක් හෝ නමක් නොමැත |
| හවුල්කරුවන් 2-20ත් අතර සම්බන්ධයකි | හවුල් කරුවන් සංඛ්‍යාව සීමාවක් නොමැත |
| ව්‍යාජ නමකින් පවත්වා ගනී නම් ලියාපදිංචි කළ යුතුය | ලියා පදිංචි කළ යුතු නැත |
| හවුල් ව්‍යාපාර සඳහා බලපාන යම් යම් නීති රීති ඇත | විශේෂයෙන් බලපාන නීති රීති නැත |
| ව්‍යාපාරය නමින් ගිණුම් තැබීම සිදු කරයි | බොහෝවිට පෞද්ගලිකව ගිණුම් තැබීම කරයි |

JMC vLearning "your virtual learning partner"

## සංස්ථාපිත සමාගම්

සමාගම් පනත යටතේ සංස්ථාපිත නෛතික පුද්ගල භාවයක් ඇති වගකීම සීමා සහිත හෝ රහිත කොටස්කරුවන්ගෙන් සමන්විත සංවිධාන විශේෂය සංස්ථාපිත සමාගම් වේ.

සංස්ථාපිත සමාගම් වල මූලික ලක්ෂණ

1. වගකීම - සීමිත හෝ අසීමිත විය හැක
2. නෛතික පුද්ගලභාවය - නෛතික දෘෂ්ටිය අනුව කොටස්කරුවන්ගෙන් වෙන් වූ නෛතික අනන්‍යතාවයක් සමාගමක් සතු වේ
3. පැවැත්ම - අඛණ්ඩ පැවැත්මක් තිබේ

4. පාලනය - කොටස්කරුවන් විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂක මණ්ඩලයකට සමාගමේ කළමනාකරණ කටයුතු පැවරේ
5. සංස්ථාපනය කිරීම - සංස්ථාපනය අනිවාර්‍ය වන අතර එය 2007 අංක 07 දරණ සමාගම් පනත අනුව සිදු කෙරේ
6. ගිණුම් තැබීම හා විගණනය - ගිණුම් තැබීම හා විගණනය අනිවාර්‍ය වන අතර සුදුසුකම් ලත් විගණකවරයෙකු මගින් විගණනය කල යුතු වේ.

JMC vLearning "your virtual learning partner"

## සංස්ථාපිත සමාගම් වල වාසි

1. නෛතික පුද්ගලභාවයක් පැවතීම
2. විශාල ප්‍රාග්ධනයක් එකවර රැස්කරගත හැකි වීම
3. සාමාජිකයන්ගේ වගකීම සීමා සහිත වීම
4. අඛණ්ඩ පැවැත්මක් තිබීම
5. මහා පරිමාණව ව්‍යාපාර කටයුතු සිදු කිරීම නිසා මහා පරිමාණ පිරිමැසුම් ලබාගත හැකි වීම
6. අයිතිකරුවන්ගෙන් කළමනාකාරිත්වය වෙනස් වීම නිසා දක්ෂ කළමනාකරුවන් සම්බන්ධ කරගත හැකි වීමෙන් කළමනාකරණය කාර්යක්ෂම වීම.

JMC vLearning "your virtual learning partner"

## සංස්ථාපිත සමාගම් වල අවාසි

1. ආරම්භ කිරීමට විශාල පිරිවැයක් දැරීමට සිදුවීම හා සංකීර්ණ කටයුත්තක් වීම
2. නීතිමය බලපෑම අධික වීම
3. ලාභ ද්විත්ව බදු ගණනයකට ලක් වීම
4. අලාභ ව්‍යාපාරය තුළම රැඳීම
5. විසුරුවා හැරීමේදී වුවද සංකීර්ණ ක්‍රියාදාමයක් අනුගමනය කිරීමට සිදුවීම
6. කොටස් සංඛ්‍යාව මත චන්ද බලය හිමිවන බැවින් සුළු කොටස් හිමියන්ට වැඩි බලයක් හිමි නොවීම.

## සමාගම් සංස්ථාපනය කිරීමේදී අනුගමනය කලයුතු මූලික පියවර

1. එක් එක් ආරම්භක කොටස් හිමියන් විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියෙහි වූ ඉල්ලුම් පත්‍රය භාරදීම
2. සමාගම සඳහා නාමය අනුමත කර ගැනීම
3. සාංගමික ව්‍යවස්ථාවලිය පිළියෙල කිරීම හා කොටස් හිමියන් ඊට අත්සන් කිරීම
4. සමාගමේ අධ්‍යක්ෂවරුන් පත් කිරීම හා ඊට කැමැත්ත ප්‍රකාශ කිරීම
5. සමාගමේ ලේකම්වරුන් පත් කිරීම හා ඊට කැමැත්ත ප්‍රකාශ කිරීම
6. අදාල ලියවිලි නියමිත ආකෘතියෙන් ඉදිරිපත් කර ඇති බව තහවුරු කළ පසු එක් එක් ලියවිල්ලට නියමිත ගාස්තු හා බදු මුදල් ගෙවා රිසිට් පත ලබා ගැනීම
7. සංස්ථාපන සහතිකය ලබාගැනීම හා ප්‍රසිද්ධ දැන්වීමක් පළ කිරීම.

## සමාගමක් සංස්ථාපනය කිරීමට අදාල ලියවිලි

2007 අංක 07 දරණ සමාගම් පනත අනුව සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා සමාගමේ එක් එක් ආරම්භක කොටස් හිමියන් විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියෙහි වූ ඉල්ලුම් පත්‍රය සමග පහත ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු වේ.

1. සාංගමික ව්‍යවස්ථාවලිය

   සමාගමේ පරමාර්ථ , කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් හා බැදීම්, කළමනාකරණය හා පරිපාලනය සම්බන්ධ තොරතුරු දැක්වෙන ලියවිල්ල වේ.

JMC vLearning
"your virtual learning partner"

2. නම පිළිබඳ ප්‍රකාශය

සමාගමේ නම දැනට පවතින සමාගමක නමට සමාන හෝ අනුරූප නොවන බවට සඳහන් කරන ප්‍රකාශයක්

3. අධ්‍යක්ෂකවරුන්ගේ ප්‍රකාශය

ආරම්භක අධ්‍යක්ෂකවරුන් ලෙස කටයුතු කිරීමට කැමැත්ත පළ කළ අයගේ නාම ලේඛනය

4. ලේකම්ගේ ප්‍රකාශය

ආරම්භක ලේකම්වරයා ලෙස කටයුතු කිරීමට කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ල.

JMC vLearning "your virtual learning partner"

## සාංගමික ව්‍යවස්ථාවලිය

සමාගමක පරිපාලනයට අදාළ විධිවිධාන ඇතුළත් ප්‍රධාන ලියවිල්ල වන අතර සමාගමක් සංස්ථාපනයට අවශ්‍ය ප්‍රධාන ලියවිල්ල වන්නේ සාංගමික ව්‍යවස්ථාවලියයි. එය සමාගම හා කොටස් හිමියන් අතර පවතින ගිවිසුමක් ලෙස හඳුනාගත හැකිය.

2007 අංක 07 දරණ සමාගම් පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති ආදර්ශ ව්‍යවස්ථාවලිය සමාගමකට භාවිත කළ හැකිවේ. එය භාවිතා නොකරන්නේ නම් සමාගම් පනතේ විධිවිධාන වලට අනුව ව්‍යවස්ථාවලියක් සකස් කළ හැකිය.

සාංගමික ව්‍යවස්ථාවලියට ඇතුළත් කළ යුතු මූලික කරුණු

1. සමාගමේ පරමාර්ථ
2. කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් හා බැඳීම්
3. සමාගමේ පරිපාලනය හා කලමනාකරණය.

සාංගමික ව්‍යවස්ථාවලියට ඇතුළත් විය යුතු කරුණු පුළුල්ව සලකා බලන විට පහත කරුණුද ඇතුළත් විය යුතු වේ.

❑ කොටස් සම්බන්ධ විස්තර

- කොටස් නිකුත් කිරීම
- කොටස් ඇරයුම් කිරීම
- ලාභාංශ බෙදා බෙදාහැරීම
- කොටස් රෙජිස්ටරය, කොටස සහතිකය, කොටස් පැවරීම.

❑ කොටස් හිමියන්ගේ රැස්වීම් වලට අදාළ රීති

- රැස්වීම් පිළිබඳ දැන්වීම්
- රැස්වීම් පැවැත්වීමේ ක්‍රම
- ඝණපූර්ණය
- සභාපති පිළිබඳ විස්තර
- ඡන්දය පිළිබඳ විස්තර
- ප්‍රතියුක්තිකයන් පිළිබඳ විස්තර
- රැස්වීම් වාර්තා පිළිබඳ විස්තර
- කොටස් හිමිකරු යෝජනා පිළිබඳ විස්තර
- කොටස් හිමියන්ගේ ඡන්දය පිළිබඳ විස්තර
- ඇරයුම් නොගෙවුවහොත් ඡන්දය දීමට ඇති අයිතිය නැති වීම
- කොටස් හිමියන්ගේ වාර්ෂික රැස්වීම් සහ අති විශේෂ රැස්වීම්.

JMC vLearning "your virtual learning partner"

❑ අධ්‍යක්ෂවරුන් හා ලේකම්

- අධ්‍යක්ෂකවරුන් පත් කිරීම සහ ඉවත් කිරීම
- අධ්‍යක්ෂවරුන්ගේ බලතල සහ කාර්යයන්
- අධ්‍යක්ෂකවරුන්ගේ රැස්වීම් වල කාර්ය පටිපාටිය
- සභාපති (ධූරකාලය)
- ගණපූර්ණය
- රැස්වීම් පිළිබඳ දැන්වීම්
- රැස්වීම් පැවැත්වීමේ ක්‍රම
- ඒකමතික යෝජනා සම්මතයන්
- ඡන්දය දීම
- කළමනාකරණ අධ්‍යක්ෂක හා වෙනත් විධායක අධ්‍යක්ෂකවරුන්
- ලේකම්වරයා පිළිබඳ .

❑ ගිණුම් හා විගණනය

- ගිණුම් වාර්තා, මූල්‍ය ප්‍රකාශන හා විගණනය ආදිය

❑ ඈවර කිරීම හා ලේඛනයෙන් ඉවත් කිරීම

- ඈවරකරු පත් කිරීමේ යෝජනා සම්මතය
- අතිරික්ත වත්කම් බෙදාහැරීම

❑ විවිධ

- සමාගම විසින් තැබියයුතු ලේඛන
- ලේඛන ආදිය සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන් හා කොටස් හිමියන් සතු අයිතිවාසිකම්
- දැන්වීම්
- පුද්ගලික සමාගම් සම්බන්ධයෙන් මද වශයෙන් වෙනස් කිරීම්.

JMC vLearning
"your virtual learning partner"

සමාගමක් සඳහා නමක් යෙදීම

සමාගම් පනතේ (6) වන වගන්තිය අනුව නාමයන් පිළිබඳ නියමයන් පහත පරිදි වේ

1. සෑම සීමාසහිත සමාගමකම නමේ මුලට "**සීමාසහිත**" යන වචනය හෝ එහි කෙටි යෙදුම වන "**සී/ස**" යන්න යෙදිය යුතුය

2. සෑම පෞද්ගලික සමාගමක්ම නමේ මුලට "**සීමාසහිත**" යන වචනය හෝ එහි කෙටි යෙදුම වන "**සී/ස**" යන්න සහ අගට යෙදෙන "**සමාගම**" යන වචනයට පූර්වයෙන් "**(පෞද්ගලික)**" යන වචනය හෝ එහි කෙටි යෙදුම් වන "**(පෞද්)**" යන්න යෙදිය යුතුය

3. නිල ලැයිස්තුගත සමාගමක් වන සෑම සමාගමකම නමේ මුලට "සීමාසහිත" යන වචනය හෝ එහි කෙටි යෙදුම් වන "සී/ස" යන්න සහ "සමාගම" යන වචනයට පූර්වයෙන් "(පොදු)" යන වචනය යෙදිය යුතුය

උදාහරණ - පෞද්ගලික සමාගම

සීමාසහිත රාජපක්ෂ පෞද්ගලික සමාගම

සී/ස රාජපක්ෂ (පෞද්) සමාගම

Rajapaksha (Private) Limited

Rajapaksha (Pvt) Ltd

JMC vLearning "your virtual learning partner"

උදාහරණ - නිල ලැයිස්තුගත සීමිත පොදු සමාගම

සීමාසහිත රාජපක්ෂ (පොදු) සමාගම

සී/ස රාජපක්ෂ (පොදු) සමාගම

Rajapaksha Public Limited Company

උදාහරණ - නිල ලැයිස්තුගත සීමිත පොදු සමාගම

සීමාසහිත රාජපක්ෂ සමාගම

සී/ස රාජපක්ෂ සමාගම

Rajapaksha Limited

Rajapaksha Ltd

JMC vLearning "your virtual learning partner"

සමාගම් පනතේ (07) වන වගන්තිය අනුව නම් සම්බන්ධයෙන් වූ සීමා කිරීම්

වෙනත් යම් සමාගමක හෝ ලියා ලියාපදිංචි කළ හෝ විදේශීය සමාගමක නමට සාකල්‍යයෙන්ම අනුරූප වන නමක් භාවිතා කළ නොහැකිය

පුන්‍ය සමාගමක් වන්නේ නම් මිස "වාණිජ මණ්ඩලය" යන වචනය යෙදීම කළ නොහැකිය

රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව නොමග යවන සුළු නමක් යෙදීම කළ නොහැකිය

ජාතියේ යහපත සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් දෙනු ලබන කැමැත්ත ඇතිව මිස පහත් සඳහන් නම් භාවිතා කළ නොහැක

ජනාධිපතිවරයා හෝ ජනාධිපති යන වචන

නාගරික හෝ සංස්ථාපිත යන වචන

සමූපකාරය හෝ සමිතිය යන වචන

ජාතික, රාජ්‍ය හෝ ශ්‍රී ලංකා යන වචන

## සමාගමේ නම හා අංකය භාවිතා කිරීම

1. සමාගමේ සියලුම ව්‍යාපාරික ලිපි වල ලිපි ශීර්ෂයන්හි ඇතුළත් කෙරේ
2. සමාගමේ සියලුම දැන්වීම් වල හා වෙනත් නිල ප්‍රකාශන වල ඇතුළත් කෙරේ
3. සමාගමේ ඉන්වොයිස් වල, ලදුපත්වල හා ණයවර ලිපි වල ඇතුළත් කෙරේ
4. සමාගමේ නිල මුද්‍රාවේ ඇතුළත් කෙරේ
5. සමාගම වෙනුවෙන් අත්සන් කරන ලද විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු, පිටසන් කිරීම් , චෙක්පත් හෝ මුදල් හෝ භාණ්ඩ ඇනවුම් වල ඇතුළත් කෙරේ
6. සමාගමේ නෛතික බැඳීම්ක් ඇති කරන සමාගම නිකුත් කරන හෝ අත්සන් කරන වෙනත් ලේඛන වල ඇතුළත් කෙරේ.

JMC vLearning "your virtual learning partner"

## සංස්ථාගත කිරීමේ සහතිකය

අදාල නාමය දරණ සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ වූ සියලු නියමයන් සපුරා නිශ්චිත දිනක සිට සමාගමක් ලෙස සංස්ථාගතව ඇති බව සහතික කරමින් සමාගම් රෙජිස්ට්‍රාර් වරයා විසින් නිකුත් කරන සහතිකයයි

මෙය සම්මුති සහතිකය, සංස්ථාපන සහතිකය ලෙසද හඳුන්වයි

### සංස්ථාගත කිරීමේ සහතිකයෙහි අඩංගු වන තොරතුරු

1. සමාගමේ නම සහ අංකය
2. සමාගම සංස්ථාගත කරන ලද දිනය
3. සමාගම සීමාසහිත සමාගමක්ද, සීමාරහිත සමාගමක්ද, ඇපයෙන් සීමිත සමාගමක් ද යන වග
4. සමාගම පෞද්ගලික සමාගමක් ද යන වග
5. සමාගම අක්වෙරළ සමාගමක් ද යන වග.

### සමාගමකට සංස්ථාගත කිරීමේ සහතිකයේ ඇති වැදගත්කම

සමාගම සංස්ථාගත කිරීමට අදාළව සමාගම් පනතේ සියළු නියමයන්ට අනුව ක්‍රියා කර ඇති බවට සාක්ෂියක් වීම

එම සහතිකයේ සඳහන් දිනයේ දී සමාගම් පනත යටතේ සමාගම සංස්ථාගත කර ඇති බවට සාක්ෂියක් වීම.

### සීමා සහිත සමාගමක් තනි පුද්ගලයෙකු විසින් ඇරඹීම

සමාගම් පනතේ (4 (2)) වගන්තිය අනුව සමාගමක කොටස් හිමියන් දෙදෙනෙකුට වඩා අඩුවෙන් නොසිටිය යුතුය. එසේ වුවද කොටස් හිමියන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් කොටස් දරන භාණ්ඩාගාරයේ ලේකම්වරයා හෝ පුද්ගලයෙකු හෝ සංස්ථාවක් වන විට සමාගමක තනි කොටස් හිමියකු සිටිය හැකිය.

### එක් කොටස් හිමියකුට වුවද සමාගමක් ආරම්භ කිරීමට අවස්ථාව සලසා දීමෙන් රජය අපේක්ෂා කරන අරමුණු

1. තනි ව්‍යාපාරිකයෙකුගේ වත්කම් ආරක්ෂා කර ගැනීම
2. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින්ට සමාගම් ආරම්භ කර සමාගම්වලට හිමි වරප්‍රසාද භුක්ති විඳීමට අවස්ථාව ලබා දීම
3. වෘත්තිකයන්ගේ ව්‍යාපාර සඳහා සමාගම්වලට හිමි වරප්‍රසාද භුක්ති විඳීමට අවස්ථාව ලබා දීම.

JMC vLearning "your virtual learning partner"

## සමාගම් පනත අනුව සංස්ථාපනය කළ හැකි විවිධ සමාගම් වර්ග

1. සීමාසහිත සමාගම්
   - පෞද්ගලික සමාගම්
   - පොදු සමාගම්
2. සීමාරහිත සමාගම්
3. ඇපයෙන් සීමිත සමාගම්
4. පුනය සමාගම්
5. අක්වෙරළ සමාගම්
6. විදේශ සමාගම්

## සීමාරහිත සමාගම්

කොටස්කරුවන්ගේ වගකීම සාංඝමික ව්‍යවස්ථාවලියේ සඳහන් පරිදි කොටස්කරුවන්ට නිකුත් කරන ලද කොටස් ප්‍රමාණයට සීමා නොවන සමාගම් වේ. නැතහොත් සමාගමේ වගකීම් බේරුම් කිරීම සඳහා අසීමිතව වග කියන කොටස් හිමියන් ගෙන් යුක්ත සමාගම් වේ.

## සීමාසහිත සමාගම්/ කොටසින් සීමිත සමාගම්

කොටස්කරුවන් මිලදී ගත් කොටස් වෙනුවෙන් ගෙවූ හෝ ගෙවීමට බැඳී සිටින වටිනාකමට පමණක් ඔවුන්ගේ වගකීම් සීමා වන සමාගම් වේ. මෙම සමාගම් සීමා සීමාසහිත පුද්ගලික සමාගම්, සීමාසහිත පොදු සමාගම් හෝ අක්වෙරළ සමාගම් ලෙස සංස්ථාපනය කළ හැකිය.

## අක්වෙරළ සමාගම්

ශ්‍රී ලංකාවෙන් පිටත ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ සමාගම් පනතේ සංස්ථාපනය කරන ඇති සමාගම් වේ. විදේශයකදී සංස්ථාගත කළ සමාගමක් වුවත් ශ්‍රී ලංකාවේ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ව්‍යාපාර කටයුතු විදේශයක දී පමණක් සිදු කරන්නේ නම් ඒවාද අක්වෙරළ සමාගම් ලෙස සැලකේ.

JMC vLearning "your virtual learning partner"

## ඇපයෙන් සීමිත සමාගම්

සමාගම ඈවර කරන අවස්ථාවකදී සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් නිශ්චිත ප්‍රමාණයක් දක්වා පමණක් බාහිර ණය සම්බන්ධයෙන් වගකීමට එකඟ වූ සාමාජිකයන් සිටින සීමිත සමාගම් වේ

ඇපයෙන් සීමිත යන්නෙහි අර්ථය වන්නේ යම් දිනක සමාගම බුන්වත් වී හෝ වෙනත් හේතුවක් නිසා හෝ සමාගම ඈවර කරන අවස්ථාවක බාහිර ණය පියවීමට ප්‍රමාණවත් මුදල් නොමැති වුවහොත් ඒ සඳහා අවශ්‍ය අරමුදල් සැපයීමට සාමාජිකයන් බැඳී සිටීම හෝ ඇප වීමයි. සමාගම ආරම්භ කරන අවස්ථාවේදී ම ඒ ඒ සාමාජිකයා ඇපවන ප්‍රමාණය (ඇපකර) ලබාදිය යුතුය.

## ඇපයෙන් සීමිත සමාගමක මූලික ලක්ෂණ

1. කොටස් නිකුත් කිරීමක් සිදු නොකිරීම - සාංගමික ව්‍යවස්ථාවලියේ එක් එක් සාමාජිකයා විසින් සමාගම ඈවර කිරීමේදී දායක විය යුතු ප්‍රමාණයන් සඳහන් කළ යුතු වීම
2. අවම වශයෙන් සාමාජිකයින් දෙදෙනකුවත් සිටිය යුතු වීම (උපරිමය සීමාවක් නැත)
3. පොදු පරමාර්ථ පෙරදැරි කරගෙන ආරම්භ කිරීම
4. සමාගමේ ලාභ බෙදාහැරීමක් සිදු නොකිරීම.

## පුණ්‍ය සමාගම්

වාණිජ්‍ය, කලාව, විද්‍යාව, ආගම, පුණ්‍ය කටයුතු, ක්‍රීඩා හෝ වෙනත් ප්‍රයෝජනවත් පරමාර්ථයක් ප්‍රවර්ධනය සඳහා පිහිටවනු ලබන ලාභය හෝ ආදායමක් ඇත්නම් එය පරමාර්ථ ප්‍රවර්ධනය සඳහා යොදනු ලබන එසේම සාමාජිකයන්ට ලාභාංශ ගෙවීම තහනම් වන ඇපයෙන් සීමිත සමාගමක් ලෙස හෝ සීමා සහිත සමාගමක් ලෙස පිහිටුවීමට හැකි සමාගම් විශේෂය පුණ්‍ය සමාගම් වේ.

පුණ්‍ය සමාගමක ලක්ෂණ

1. සමාජ සුභසාධනය අරමුණු වීම
2. ලබන ලාභය හෝ ආදායම සමාජ සුබ සාධනය සඳහාම යොදවන බව
3. සාමාජිකයින් අතර ලාභාංශ නොබෙදෙන බව .

උදාහරණ

1. ලංකා ඔටෝ මොබයිල් සංගමය
2. කොළඹ තරුණ බෞද්ධ සංගමය
3. සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය.

විදේශීය සමාගම්

විදේශ රටකට සංස්ථාගත කර ඇති සමාගමක් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා මෙරට සමාගම් පනතේ ද ලියාපදිංචිව කර ඇත්නම් එවැනි සමාගමක් විදේශීය සමාගමක් ලෙස හැඳින්වේ. මේවා **අනේවාසික, නිර්නේවාසික, නිර්වාසික, එතෙර සමාගම්** යනාදී නම්වලින් ද හැඳින්වේ

විදේශ සමාගමක් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් ස්ථාපිත කර මසක් ඇතුලතදී සමාගම පිළිබඳ විස්තරයක් ශ්‍රී ලංකාවේ සමාගම් රෙජිස්ට්‍රාර් වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සමාගම පිළිබඳ පරීක්ෂාකර බලා එම විදේශීය සමාගම ලියාපදිංචි කළ විදේශීය සමාගමක් ලෙස විදේශ සමාගම් ලේඛනයේ ඇතුළත් කරයි. විදේශීය සමාගම් මෙරට සමාගම් පනත යටතේ සංස්ථාගත නොකරන අතර ලියාපදිංචිය පමණක් සිදු කරයි

JMC vLearning "your virtual learning partner"

පෞද්ගලික සමාගම්

සමාගමේ ප්‍රාග්ධනය සපයා ගැනීමට ප්‍රසිද්ධියේ කොටස් නිකුත් නොකරන නෑදෑ හිතමිතුරන්ගෙන් පමණක් ප්‍රාග්ධනය සපයා ගන්නා සමාගම් සීමිත පෞද්ගලික සමාගම් ලෙස හැඳින්වේ. ඒ අනුව පෞද්ගලික යන පදයෙන් අදහස් කරන්නේ ප්‍රසිද්ධියේ කොටස් නිකුත් කිරීමට හෝ නිදහසේ කොටස් පැවරීමට නොහැකි බවයි.

පෞද්ගලික සමාගම්වල ප්‍රධාන ලක්ෂණ

1. අයිතිය - කොටස්කරුවන් සතුවීම

2. ප්‍රාග්ධනය - කොටස් නිකුත් කිරීමෙන් සපයා ගනී. ප්‍රසිද්ධියේ කොටස් නිකුත් කිරීම තහනම් වන අතර නිදහසේ කොටස් පැවරීමට නොහැකිය

3. කොටස්කරුවන් සංඛ්‍යාව - අවමය 01, උපරිමය 50

4. කළමනාකරණය - අධ්‍යක්ෂක මණ්ඩලයක් මගින් සිදුවේ අවම 01 වන අතර උපරිමය සීමාවක් නැත

5. පාලනය - ව්‍යවස්ථාපිත පාලනයට හා කොටස්කරුවන්ගේ සාමූහික පාලනයට යටත් වේ

6. නෛතික පුද්ගලභාවය - නෛතික පුද්ගලභාවයක් ඇත

7. වගකීම - සීමාසහිත වේ

8. පැවැත්ම - අඛණ්ඩ පැවැත්මක් ඇත

9. සංස්ථාපනය - සමාගම් පනත අනුව සංස්ථාපනය අනිවාර්යය වේ

JMC vLearning "your virtual learning partner"

14. ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය පැවැත්වීම - ණය ගෙවීමේ හැකියාව පිළිබඳව පරීක්ෂණයකින් තොරව සියලුම කොටස්කරුවන්ගේ කැමැත්ත මත ලාභාංශ බෙදා හැරිය හැකිය

15.සම්බන්ධතා රෙජිස්ටරය පවත්වා ගැනීම - කොටස්කරුවන්ගේ ඒකමතික යෝජනා සම්මතයකින් අධ්‍යක්ෂක මණ්ඩලය සමාගම සමග කරන ගනුදෙනු විස්තරාත්මකව දැක්වෙන සම්බන්ධතා රෙජිස්ටරය පවත්වාගෙන යාමෙන් වැළකිය හැකිය.

පෞද්ගලික සමාගම් වල වාසි

1. අයිතිය පවුලේ ඥාතීන් හිතවතුන් අතරේ පවත්වාගෙන යා හැකි වීම
2. සමාගමේ පාලන බලය සීමිත පිරිසක් අතරේ රඳවා ගැනීමට හැකි වීම
3. ලාභය සීමිත පිරිසක් අතරේ බෙදා ගැනීමට හැකි වීම
4. වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි වීම
5. වගකීම සීමිත වීම
6. නීතිමය පුද්ගලභාවයක් පැවතීම
7. පොදු සමාගම් වලට සාපේක්ෂව නීතිමය බලපෑම අඩුවීම
8. අඛණ්ඩ පැවැත්මක් හිමි වීම
9. අධ්‍යක්ෂක මණ්ඩලය මගින් කළමනාකරණය නිසා කළමනාකරණය කාර්‍යක්ෂම වීම
10. විවිධ බදු සහන ලැබීමේ හැකියාව.

## පෞද්ගලික සමාගම් වල අවාසි

1. පොදු සමාගම් වලට සාපේක්ෂව අඩු ප්‍රාග්ධන සම්පාදනයක් සිදු වේ
2. කොටස් වෙළඳපොලේ ලේඛණගත විය නොහැකි වීම
3. කොටස් නිදහසේ පැවරීම කළ නොහැකි වීම
4. සමාගම් පනතේ නීතිමය අවශ්‍යතා ඉටුකළ යුතු වීම
5. සංස්ථාපනය කිරීම සංකීර්ණ වීම හා ඉහළ පිරිවැයක් දැරීමට සිදු වීම
6. පරිපාලන වියදම් අධික වීම.

## පොදු සමාගම්

සමාගමේ කොටස් ප්‍රාග්ධනය සඳහා ප්‍රසිද්ධියේ ජනතාව සහ සහභාගි කරවා ගත හැකි සමාගම් පොදු සමාගම් වේ. මෙහි පොදු යන පදයෙන් අදහස් කරන්නේ ප්‍රසිද්ධියේ කොටස් නිකුත් කිරීම් හෝ නිදහසේ කොටස් පැවරීම් කළ හැකි බවය.

### පොදු සමාගම්වල ප්‍රධාන ලක්ෂණ

1. අයිතිය - කොටස්කරුවන් සතුවීම
2. ප්‍රාග්ධනය - කොටස් නිකුත් කිරීමෙන් සපයා ගනී. ප්‍රසිද්ධියේ කොටස් හෝ වෙනත් සුරැකුම්පත් නිකුත් කිරීම කළ හැකිය

3. කොටස්කරුවන් සංඛ්‍යාව - අවමය 01, උපරිමය සීමාවක් නැත

4. කළමනාකරණය - අධ්‍යක්ෂක මණ්ඩලයක් මගින් සිදුවේ අවම 02 වන අතර උපරිමය සීමාවක් නැත

5. පාලනය - ව්‍යවස්ථාපිත පාලනයට හා කොටස්කරුවන්ගේ සාමූහික පාලනයට යටත් වේ

6. නෛතික පුද්ගලභාවය - නෛතික පුද්ගලභාවයක් ඇත

7. වගකීම - සීමාසහිත වේ

8. පැවැත්ම - අඛණ්ඩ පැවැත්මක් ඇත

9. සංස්ථාපනය - සමාගම් පනත අනුව සංස්ථාපනය අනිවාර්යය වේ

10. ගිණුම් තැබීම සහ විගණනය - අනිවාර්යය වේ.

11. බදු ගෙවීම - සමාගම නමින් බදු ගෙවිය යුතුය

12. ඈවර කිරීම - ස්වෙච්ඡාවෙන්, අධිකරණ නියෝගයකින් හා අධිකරණයේ අධීක්ෂණය යටතේ ඈවර කිරීම කළ හැකිය

13. සමාගමේ නාමය - සමාගමේ නම සඳහන් කිරීමේ දී නමේ මුලට "සීමා සහිත" යන වචන හෝ එහි කෙටි යෙදුම වන සී/ස යන්න යෙදිය යුතුය

14. ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය පැවැත්වීම - කොටස්කරුවන්ට ලාභාංශ ගෙවීම්ට පෙර ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයක් පැවැත්විය යුතු වේ

JMC vLearning "your virtual learning partner"

15. සම්බන්ධතා රෙජිස්ටරය පවත්වා ගැනීම - අධ්‍යක්ෂක මණ්ඩලය සමාගම සමග කරන ගනුදෙනු විස්තර විස්තරාත්මකව දැක්වෙන සම්බන්ධතා රෙජිස්ටරය පවත්වා ගත යුතුය

16. ඡන්ද බලය - සෑම සාමාජිකයෙකුටම ඔහු දරන කොටස් ප්‍රමාණය අනුව ඡන්ද බලය හිමි වේ

17. කොටස් වෙළඳපළේ ලැයිස්තුගත වීමේ හැකියාව - කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලැයිස්තුගත කළ හැකිය.

කොටස් වෙළඳපොලෙහි කොටස් අලෙවි කිරීමට ලේඛණගත වී ඇති සීමිත පොදු සමාගම් නිල ලැයිස්තුගත පොදු සමාගම් වන අතර නිල ලැයිස්තුගත පොදු සමාගමක නම සඳහන් කිරීමේදී "සීමාසහිත" හෝ "සී/ස" යන්න සහ අගට යෙදෙන "සමාගම" යන වචනයට පෙර "පොදු" (PLC) යන වචනය යෙදිය යුතුය.

පොදු සමාගම් වල වාසි

1. අති විශාල ප්‍රාග්ධනයක් සම්පාදනය කරගත හැකි වීම
2. කොටස්කරුවන්ගේ වගකීම සීමිත වීම
3. අඛණ්ඩ පැවැත්මක් හිමි වීම
4. නීතිමය පුද්ගලභාවයක් පැවතීම
5. ණය ප්‍රාග්ධනය පහසුවෙන් සපයා ගත හැකි වීම/ ණයකර ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකි වීම
6. කොටස් නිදහසේ පැවරිය හැකි වීම
7. කොටස් වෙළඳපළට පිවිස නිල ලැයිස්තුගත සමාගමක් වීමට හැකිවීම
8. ආයෝජකයන් ආකර්ශනය කරගැනීම පහසු වීම
9. අධ්‍යක්ෂක මණ්ඩලය මගින් කළමනාකරණය නිසා කළමනාකරණය කාර්‍යක්ෂම වීම
10. විවිධ බදු සහන ලැබීමේ හැකියාව.

JMC vLearning "your virtual learning partner"

### පොදු සමාගම් වල අවාසි

1. අලාභ ව්‍යාපාරය තුළම රැඳීම
2. ආරම්භ කිරීමට සංකීර්ණ ක්‍රියාදාමයක් අනුගමනය කළ යුතු වීම
3. ආරම්භ කිරීමේ පිරිවැය අධික වීම
4. නීතිමය බලපෑම් අධික වීම
5. සමාගම් පනතේ නියමයන් අනුව කටයුතු කළ යුතු වීම
6. වෙනත් සමාගමක පරිපාලිතයක් වීමේ අවදානම පැවතීම
7. කළමනාකරණය සංකීර්ණ හා දුෂ්කර වීම
8. තීරණ ගැනීමේ ප්‍රමාදයන් ඇති වීම
9. පරිපාලන වියදම් වැඩිවීම
10. කොටස් සංඛ්‍යාව මත ඡන්ද බලය හිමිවන නිසා සුළු කොටස්කරුවන්ට වැඩි බලයක් හිමි නොවීම.

### සීමිත පොදු සමාගම් වලින් ආර්ථිකයට අත්වන ප්‍රතිලාභ

1. දළ ජාතික නිෂ්පාදනයට වැඩි දායකත්වයක් ලැබීම
2. රැකියා අවස්ථා වැඩියෙන් ජනනය වීම
3. තරගයට සාර්ථකව මුහුණ දිය හැකි වීම
4. නවීන තාක්ෂණය යොදා ගැනීම
5. පර්යේෂණයන් කළ හැකි වීම
6. කොටස් වෙළඳපළේ ලියාපදිංචි වන සංඛ්‍යාව වැඩි වීමෙන් කොටස් වෙළෙඳපොළ සංවර්ධනය වීම
7. කොටස් වෙළෙඳපොළ සංවර්ධනය වීමෙන් පොදු ජනතාවගේ ඉතිරිකිරීම් කොටස් වෙළෙඳපොළට ගලා ඒම හා ආර්ථිකය තුළ ඉතුරුම් වර්ධනය වීම.

JMC vLearning "your virtual learning partner"

## සංස්ථා ප්‍රකාශය

සමාගමික කොටස් හෝ ණයකර මිලදී ගැනීම් සඳහා සහ සහභාගී වන මෙන් මහජනතාවට අර්පණය (ආරාධනා) කරමින් ප්‍රසිද්ධ කරන ලියවිල්ලයි

### සංස්ථා ප්‍රකාශයක අන්තර්ගත කරුණු

1. සමාගමේ පරමාර්ථ සහ ව්‍යාපාර කටයුතු
2. ප්‍රධාන නිලධාරීන්ගේ පසුබිම හා සුදුසුකම්
3. වර්තමාන මූල්‍ය තත්ත්වය
4. උපකල්පන සහිත ප්‍රක්ෂේපිත මූල්‍ය ප්‍රකාශන
5. අවදානම් විශ්ලේෂණය
6. කොටස් නිකුතු මිල
7. ණයකර සඳහා ලබාදෙන පොළිය සහ මූලික ගෙවීම් විස්තර.

## කොටස් බලපත්‍රය

වර්තමානයේ ගිවිසගත් මිලකට අනාගතයේ දී කිසියම් සමාගමක කොටස් මිල ගැනීමේ අයිතිය ලබා දෙමින් නිකුත් කරන ලියවිල්ල කොටස් බලපත්‍රයයි

- කොටස් හිමියාගේ නම සඳහන් නොකර සමාගමේ නිල මුද්‍රාව තබා නිකුත් කරන මෙය ගණුදෙනු කළ හැකි ලියවිල්ලකි
- කොටස් බලපත් බලපත්‍රය හිමි පුද්ගලයා එම සමාගමේ නීත්‍යානුකූල කොටස් හිමියකු නොවේ
- එය අතැති පුද්ගලයා සමාගම විසින් තීරණය කරන ලාභාංශ සඳහා හිමිකම් කියාපායි
- කූපන් ක්‍රමයක් මගින් මේ සඳහා ලාභාංශ ගෙවනු ලැබේ.

## කොටස් සහතිකය

සමාගමේ නිශ්චිත කොටස් ප්‍රමාණයක් මිලට ගෙන ඇති බවත් ඔහු සමාගමේ සාමාජිකයෙකු බවත් දක්වමින් දැනට ගෙවා ඇති වටිනාකමට කොටස් හිමියාගේ නමින් සමාගමේ නිල මුද්‍රාව සහ ලේකම් සහ අධ්‍යක්ෂකවරයෙකුගේ අත්සන සහිතව නිකුත් කරන ලියවිල්ලයි

JMC vLearning "your virtual learning partner"

## කොටස් සහතිකයක අඩංගු මූලික තොරතුරු

1. සමාගමේ නම
2. කොටස් හිමියාගේ නම
3. ලබාගත් කොටස් සංඛ්‍යාව
4. කොටසක් සඳහා දැනට ගෙවා ඇති වටිනාකම
5. කොටස් සහතිකයේ අනුක්‍රමික අංකය
6. සමාගමේ නිල මුද්‍රාව
7. අධ්‍යක්ෂක ලේකම්ගේ අත්සන.

## වාර්ෂික වාර්තාව

පූර්ව වර්ෂයේ සිදු වූ සම්පූර්ණ ක්‍රියාවන්වල විස්තරාත්මක වාර්තාවක් ලෙස වාර්ෂික වාර්තාව හඳුන්වන අතර ඒ මගින් කොටස් කරුවන්ට සහ අනෙකුත් පාර්ශවයන්ට සමාගමේ කටයුතු පිළිබඳව තොරතුරු සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳව තොරතුරු ලබාදීම බලා බලාපොරොත්තු වේ

## සමුපකාරය

සිය ආර්ථික සමාජයීය හා සංස්කෘතිමය අපේක්ෂාවන් ඉටුකර ගැනීම උදෙසා ස්වෙච්ඡාවෙන් එක්සත් වූ පුද්ගලයින්ගේ සාමූහික අයිතිය සහිතව පවත්වාගෙන යන ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පාලනය වන ස්වාධීන ව්‍යාපාර ඒකකයකි

JMC vLearning
"your virtual learning partner"

## සමුපකාර ව්‍යාපාරයේ සුවිශේෂී ලක්ෂණ

1. ගනුදෙනුකරුවන්ට අයිතිය හිමිවන ව්‍යාපාර සංවිධාන වර්ගයක් වීම
2. යෙදූ මුදල හෝ සේවය සැලකිල්ලට නොගෙන එක් සාමාජිකයෙකුට එක් ඡන්දය බැගින් හිමි වීම
3. කොටස් වල අගය වෙනස් නොවී පැවතීම
4. උපයන සියලුම අතිරික්ත ආදායම සාමාජිකයන් සතුවේ. අතිරික්තයෙන් කොටසක් අනාගත ආයෝජනයට වෙන් කරන අතර ඉතිරිය ගිවිසගත් පරිදි සාමාජිකයින් අතර බෙදා හරියි (අනුග්‍රාහක ප්‍රති ගෙවීම්/ අනුග්‍රාහක දීමනාවන්)
5. ණය සඳහා ගෙවිය හැකි පොලී මට්ටම සීමිත වීම
6. ලාභය මූලික අරමුණ නොවීම
7. සාමාජික හා සමාජයීය යහපත උදෙසා කටයුතු කිරීම.

## සමුපකාර ව්‍යාපාරයේ ලක්ෂණ

1. සාමාජිකත්වය - කොටස් මිලදී ගැනීම තුළින් සාමාජිකත්වය ලබාගත හැකිය. දැනට කොටසක අවම වටිනාකම රුපියල් 100 කි අවම සාමාජිකයින් ගණන 10කි
2. ප්‍රාග්ධනය - සාමාජිකයන්ට කොටස් විකිණීමෙන් හා රජයේ අරමුදල් මගින් ප්‍රාග්ධනය සපයා ගනී
3. ලියාපදිංචිය - (1972) අංක (5) දරණ සමුපකාර පනත යටතේ ලියාපදිංචිය කොමසාරිස්වරයා විසින් සිදු කරයි
4. නීතිමය පුද්ගලභාවය - නීතිමය පුද්ගලභාවයක් ඇත
5. පරිපාලනය - සාමාජිකයින් මහා සභා රැස්වීමේදී පත් කරනු ලබන අධ්‍යක්ෂක මණ්ඩලය මගින් සිදුවේ

6. වගකීම - සාමාජිකයන් මිලදී ගත් කොටස්වල නාමික අගයට සීමා වේ. එහෙත් සීමා රහිත ණය දෙන සමිති වල වගකීම සීමා රහිත වේ

7. ගිණුම් තැබීම හා විගණනය - සමුපකාර ව්‍යාපාරයට විශේෂිත වූ ගිණුම් තැබීමක් අනුගමනය කරන අතර එය අනිවාර්යයෙන්ම අනුගමනය කළ යුතු වේ

8. විසුරුවා හැරීම - සමුපකාර සමිතියක් විසුරුවා හැරීමට හෝ ලියාපදිංචිය අවලංගු කිරීමට සමුපකාර කොමසාරිස්වරයාට බලය පවරා ඇත.

JMC vLearning "your virtual learning partner"

## වරලත් ව්‍යාපාර

කිසියම් නිෂ්පාදිතයක් පිළිබඳ නිෂ්පාදනය, සේවය හෝ විකිණීම පිළිබඳ සමාගමක් සතු අයිතිය වෙනත් ව්‍යාපාරයකට ලබාදීමයි. මෙහිදී නිෂ්පාදිතයේ අයිතියි ඇති සමාගමේ වෙළඳ නාමය භාවිත කිරීමට වෙනත් ආයතනයකට අවසර ලැබේ

- වරලත් ව්‍යාපාර සම්බන්ධතාව තුළ හඳුනාගත හැකි පාර්ශව දෙකකි
  - සමාගමේ වෙළඳ නාමය යටතේ භාණ්ඩ විකිණීමට අවසර දෙනු ලබන මව් ආයතනය
  - මව් ආයතනයෙන් අවසර ලබා ගන්නා වරලත් ලාභී ආයතනය

- වරලත් ව්‍යාපාර සම්බන්ධතාව තුළ හඳුනාගත හැකි පාර්ශව දෙකකි

- වරලත් හිමියා සහ වරලත් ලාභියා අතර ඇතිවන ගිවිසුම වරලත් ගිවිසුම ලෙස හැඳින්වෙන අතර ගිවිසුමේ ප්‍රතිෂ්ඨාව වන වරලත් ලාභියා විසින් වරලත් හිමියා වෙත මාසිකව ගෙවිය යුතු ගාස්තුව පුරස්කාරය ලෙස හැඳින්වේ

## වරලත් ව්‍යාපාර වර්ග කිරීම

### නිෂ්පාදන වරලත් ව්‍යාපාර







මෙම ව්‍යාපාර භාණ්ඩ නිෂ්පාදනය කර බෙදා හැරීමට වරලත් ලාභියාට අයිතිය පැවරෙන ව්‍යාපාරයි. වරලත් ව්‍යාපාරිකයාගේ වෙළඳ ලකුණ යටතේ භාණ්ඩ නිෂ්පාදනය කරයි.

### නිෂ්පාදිත වරලත් ව්‍යාපාර




වරලත් හිමියාගේ වෙළඳ ලකුණ සහිත භාණ්ඩ මිලදී ගෙන නැවත විකිණීමට වරලක් ලාභියාට අයිතිය පැවරෙන ව්‍යාපාර වේ.

JMC vLearning virtual learning partner

## ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර







වරලත් හිමියාගේ නමින් ව්‍යාපාර පවත්වාගෙන යාමට වරලත් ලාභියාට අයිතිය හිමි වන ව්‍යාපාර මේ යටතට ගැනේ .

## පොදු අංශයේ / රාජ්‍ය අංශයේ ව්‍යාපාර

හිමිකාරිත්වය රජය, පළාත් සභා හෝ පළාත් පාලන ආයතන සතු වන ජනතාවට ප්‍රතිලාභ ලබා දීම සඳහා පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර පොදු ව්‍යවසායන් ලෙස හැඳින්වේ

### පොදු ව්‍යවසායන් වර්ග කිරීම

- මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යාපාර
  - රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා රාජ්‍ය සමාගම්
- පළාත් සභා සතු ව්‍යාපාර
- පළාත් පාලන ආයතන සතු ව්‍යාපාර
  - මහ නගර සභා සතු ව්‍යාපාර
  - නගර සභා සතු ව්‍යාපාර
  - ප්‍රාදේශීය සභා සතු ව්‍යාපාර

JMC vLearning
"your virtual learning partner"

රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය සැසඳීම

| රාජ්‍ය අංශය | පෞද්ගලික අංශය |
|---|---|
| අයිතිය මධ්‍යම රජයට හෝ පළාත් ආණ්ඩුවකට අයත් වේ | එක් පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට අයත් වේ |
| මූල්‍ය මාර්ග සමන්විත වන්නේ මහජන අරමුදල්වලින් වේ | පුද්ගලයින් හා ආයතන මූල්‍ය දරන අතර එය තනි පුද්ගලයින්, හවුල් හවුල්කරුවන් හා කොටස් කරුවන්ගෙන්ද, වෙන්ත් මූල්‍ය මාර්ගවලින් ද සපයා ගනී |
| ප්‍රධාන අරමුණ ජනතා සේවය නැතහොත් සුබසාධනයයි | ප්‍රධාන අරමුණ ලාභයයි |

පොදු හිමිකාරිත්වය යටතේ ව්‍යාපාර පවත්වාගෙන යාමට බලපා ඇති විවිධ හේතු

1. ඒකාධිකාරය පාලනය කිරීම
2. ලාභදායී නොවන එහෙත් මහජනයාට අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාමට
3. පෞද්ගලික අංශය විසින් අධික ලාභ ලැබීම නිසා ජනතාවට වන හානිය අවම කිරීම
4. වැදගත් මහා පරිමාණ සංවර්ධන ක්‍රම පවත්වාගැනීම
5. නාස්තිය අවම කිරීම
6. පුද්ගලික අංශය සමග තරග කිරීමට ඇති අවශ්‍යතාව
7. සමාජ සුබසාධන සේවා පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය
8. ජාතික ආරක්ෂාවට සිදු විය හැකි තර්ජන අවම කිරීම.

JMC vLearning "your virtual learning partner"

### රාජ්‍ය සංස්ථා

සමාගම් පනත හැර වෙනත් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලද්දා වූ හෝ රජය විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් අරමුදල් සපයන්නාවූ ආයතනයකි

රාජ්‍ය සංස්ථා පිහිටුවිය හැකි ආකාර දෙකකි

01 පොදු පාර්ලිමේන්තු පනතක් මගින්

- 1957 අංක 49 දරණ කාර්මික නීතිගත සංස්ථා පනත
  - ලංකා තුනී ලෑලි සංස්ථාව
  - ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය

02 විශේෂ පාර්ලිමේන්තු පනතක් මගින්

- 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත
  - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.

JMC vLearning "your virtual learning partner"

### රාජ්‍ය සංස්ථා හඳුන්වන විවිධ නම්

රාජ්‍ය නීතිගත සංස්ථාව/ සමායතනය / සංයුක්ත මණ්ඩලය/ කොමිසම/ අධිකාරිය/ කොමිෂන් සභාව/ මණ්ඩලය/ කාර්යාංශය

### රාජ්‍ය සංස්ථාවක මූලික ලක්ෂණ

1. අයිතිය - පූර්ණ වශයෙන් රජයට හෝ වැඩි ප්‍රමාණයක් රජය සතු වීම (51%) සුළු කොටස් ප්‍රමාණයක් පෞද්ගලික අංශය සතුය
2. ප්‍රාග්ධනය - රජය, පෞද්ගලික අංශය, මහජනතාව, සමුපකාර අංශය විසින් දැරිය හැකිය
3. වගකීම - වගකීම අසීමිත වේ. එසේම රාජ්‍ය සංස්ථා රජයට අයත් වන බැවින් පාර්ලිමේන්තුවටත්, මහජනතාවටත්, වගකිව යුතු වේ
4. නීතිමය පුද්ගලභාවය - නීතිමය පුද්ගලභාවයක් ඇත

5. කළමනාකරණය - ඇමතිවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් කළමනාකරණය කරයි

6. පාලනය - ව්‍යවස්ථාපිත පාලනය (පනත් හෝ ගැසට් නිවේදන)
   - අමාත්‍යාංශ පාලනය
   - පාර්ලිමේන්තු පාලනය (පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කමිටුව)
   - රජයේ විගණකාධිපතිගේ පාලනය

7. ලාභ බෙදීම - කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන අතර කොටසක් ප්‍රති ආයෝජනය කෙරේ. කොටස් නිකුත් කර තිබේ නම් කොටස් හිමියන්ට ලාභාංශ ගෙවීම සිදු වේ

JMC vLearning
your virtual learning partner

8. ගිණුම්කරණය හා විගණනය - අනිවාර්යය වේ

9. විසුරුවා හැරීම - පාර්ලිමේන්තුවේ සම්මත වූ යෝජනාවක් මගින් විසුරුවා හැරීම කළ හැකිවේ
   - සංස්ථාව මගින් ගිණුම් පියවා වසා දැමීම
   - ඈවරකරුවෙකු හෝ ඈවරකරුවන් මගින් විසුරුවා හැරීම.

රාජ්‍ය දෙපාර්තමේන්තු

පූර්ණ රාජ්‍ය හිමිකාරිත්වයක් සහ අමාත්‍යංශ ගත පරිපාලනයක් යටතේ රාජ්‍ය ප්‍රතිපත්ති වලට එකඟව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන ආයතන විශේෂය රාජ්‍ය දෙපාර්තමේන්තුවක් ලෙස හැඳින්විය හැකිය

වයාපාර කටයුතුවල යෙදෙන රාජ්‍ය දෙපාර්තමේන්තුවල ලක්ෂණ

1. අයිතිය රජය සතුය
2. වගකීම් අසීමිත වේ
3. අරමුදල් වාර්ෂික අයවැය ලේඛනය මගින් ප්‍රදානය කෙරේ
4. ආයතන සංග්‍රහය, මූල්‍ය නීති සංග්‍රහය අනුව දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් කළමනාකරණය සිදු කෙරේ
5. විගණනය විගණකාධිපති විසින් අනිවාර්යයෙන් සිදු කෙරේ

6. පාලනය පාර්ලිමේන්තු පාලනය හා අමාත්‍යංශ පාලනය යන දෙආකාරයෙන්ම සිදුවේ
7. නීතිමය කටයුතුවලදී දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නිල නාමයෙන් පෙනී සිටිය යුතු වේ
8. ලාභාලාභ රජය විඳ දරා ගනී. (සියළු ආදායම් හා ලාභ රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කෙරේ).

පළාත් පාලන ආයතන මගින් පවත්වාගෙන යන ව්‍යාපාර

ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභා යටතේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර වේ. පළාත් පාලන ආයතන හෝ මධ්‍යම රජය විසින් මූල්‍ය සපයයි. පළාත් පාලන ආයතන විසින් සිදු කරයි.